# අධ්‍යාපන අමාත්‍යාංශය

# 6 ශ්‍රේණිය - 2 කොටස

# ප්‍රායෝගික හා තාක්ෂණ කුසලතා







**මෙහෙයවීම -**

තාක්ෂණ ශාඛාව

සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ

එල්. එස්. කේ. වික්‍රමසිංහ මිය.

**සැලසුම් කිරීම සහ සකස් කිරීම -**

කේ. ඒ. ඩී. ප්‍රියානි ජයමැණිකේ මිය.

ගෘහ ආර්ථික විද්‍යා ගුරු උපදේශක

(කැලණිය අධ්‍යාපන කලාපය)

# 01 තාක්ෂණික ක්ෂේත්‍රය කෘෂිකර්මය

## නෙත පිනවන විසිතුරු ශාක









දුවේ පුතේ පෙළපොතේ පාඩම් කියවන්න. පහත දක්වා ඇති ක්‍රියාකාරකම්වල යෙදෙන්න. ඔබේ ක්‍රියාකාරකම් ඔබත් සමඟ පෙනී සිටින ඡායාරූපයකින් ගුරුතුමාට / ගුරුතුමියට ඉදිරිපත් කරන්න. ලකුණු ලබා ගන්න. සතුටු වෙන්න. ඔබේ හැකියා හඳුනා ගන්න.





1. මෙහි විසිතුරු බවට හේතු ලියන්න.
2. ප්‍රචලිත විසිතුරු ශාකවල නම් ලියන්න.
3. ප්‍රචලිත විසිතුරු මල් වර්ගවල නම් ලියන්න.
4. ඔබ කැමති ආකාරයකට ඒවායේ රූපසටහන් ගොනුවක් සකස් කරන්න. ( චිත්‍රයට නැගීම, වියලි එකතුවක්, පිංතූර, ඡායාරූප)
5. ශාකය වැඩීමේ විලාසය අනුව පරිසරය අලංකාර කරන ශාක නම් කරන්න. පිංතූර අලවන්න.









6. නිවසට යාබඳව එක් ස්ථානයක් පිරිසිඳුව සකස් කරගෙන පෙළ පොත අධ්‍යනය කරමින් විසිතුරු ශාක මඟින් අලංකාර කරන්න. ඔබේ ගුරුතුමාට / ගුරුතුමියට ඉදිරිපත් කරන්න.

7. පැල බඳුන්ගත කිරීම සඳහා පොදුවේ යොදා ගත හැකි මාධ්‍යක් සකස් කර ගත හැනීමට අවශ්‍ය ද්‍රව්‍ය සහ ප්‍රමාණ ලියන්න.

8. පෙර සඳහන් කළ ද්‍රව්‍යවලට අමතරව පහත සඳහන් ශාක සිටුවීමට අවශ්‍ය මාධ්‍ය මොනවාද?

9. සිටුවා ගත් පැලයක් නැවත බඳුන්ගත කිරීමට හේතු වන කරුණු මොනවාද?

10. නව බඳුනකට පැලයක් මාරු කිරීමේ පියවර සඳහන් කරන්න.

11. මෙම ශාක ගැලපෙන මාධ්‍යක සිටුවා අධ්‍යනය කර තොරතුරු තබා ගන්න.








12. ඔබ එහි පත්‍ර හට ගැනීම පිලිබඳ තොරතුරු තබා ගන්න.

13. එහි වර්ධනය සඳහා සහ ආරක්ෂාව සඳහා යෙදූ උපක්‍රම විස්තර කරන්න.

14. විවිධ විසිතුරු ශාක එකතුවක් කරන්න. විසිතුරු පැලවල විකුණුම් මිල ගණන් සොයන්න. ඔබේ පැලවලට වටිනාකමක් ඇති කර ගන්න උනන්දුවන්න.

15. පැල බෝ කරන ක්‍රම සොයන්න. මෙම ක්‍රියාකාරකමෙහි ප්‍රගතිය ගුරුතුමාට / ගුරුතුමියට පෙන්වා ලකුණු ලබා ගන්න.





# 02 තාක්ෂණික ක්ෂේත්‍රය ආහාර

## මුළුතැන්ගෙයි පිළිවෙළ, රැකදෙයි අහරේ රස ගුණ

පිළියෙල කරනු ලබන ආහාරයෙහි ගුණාත්මක බව ආරක්ෂා කර ගැනීමට, එම ආහාර පිළියෙල කරන ස්ථානය වන මුළුතැන්ගෙය ඉතා වැදගත් වේ. ගෙවත්තෙන් හෝ වෙළෙඳපොළෙන් ආහාර නිවසට රැගෙන එන මොහොතේ සිට ආහාර අනුභව කරන තෙක් එහි ගුණාත්මකභාවය ආරක්ෂා කර ගත යුතු ය.









1. මුළුතැන්ගෙහි කෙරෙන කාර්යයන් මොනවාද?
2. මුළුතැන්ගෙක් සැලසුම්සහගතව සංවිධානය කරන්නේ කෙසේද?
3. සැලසුම්සහගත මුළුතැන්ගෙක ක්‍රමානුකූලව වැඩ කිරීමේ දී අත්වන වාසි මොනවාද?



4. නීරෝගී දිවිපෙවෙතක් සඳහා ආහාර අනුභව කරන තෙක් එහි සුරක්ෂිත බව ආරක්ෂා කර ගන්නේ කෙසේ ද?
5. ක්‍රමවත් මුළුතැන්ගෙක ලක්ෂණ ලියන්න.
6. මුළුතැන්ගෙයි කාර්යයන් කාර්යක්ෂමතාවය වැඩි කර ගැනීමට කළ හැකි කාර්යයන් මොනවාද?
7. මුළුතැන්ගෙකට අවශ්‍ය ඒකක මොනවාද?








8. එම ඒකකවල කෙරෙන කාර්යයන් සහ කාර්යයන් කිරීම සඳහා අවශ්‍ය මෙවලම් සහ උපකරණ නම් කරන්න.

9. මුළුතැන්ගේවල පින්තූර එකතු කර අලවන්න.

10. මුළුතැන්ගෙය සැලසුම් කිරීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු මොනවා ද?

11.මුළුතැන්ගෙයක වැඩ ත්‍රිකෝණය නම් කරන්න.





12. බිම් සැලසුමක් ඇඳීමට භාවිත කරන සංකේත අඳින්න.

13.පෙළ පොත අධ්‍යනය කරමින් මුළුතැන්ගෙයක බිම් සැලසුමක් අඳින්න. අදාළ සංකේත භාවිතා කරන්න.

14. සීමිත ඉඩකඩ සහිත නිවසකට සුදුසු මුළුතැන් ගෙයක් සඳහා ඉවත දමන කුඩා පෙට්ටි භාවිතා කර අනුහුරුවක් සකස් කරන්න. කොල අලවා අලංකාර කරන්න. ගුරුතුමාට / ගුරුතුමියට ඉදිරිපත් කර ලකුණු ලබා ගන්න.





# තාක්ෂණික ක්ෂේත්‍රය - ආරම්භක තාක්ෂණවේදය

## 03


# කුඩා සරල නිමැවුම් - සාදයි සතුට මනරම්








1. ඔබ කැමති නිමැවුමක් සඳහා කටු සටහනක් අඳිනන.
2. විකසනයක් යනු කුමක්ද?
3. ඔබේ නිමැවුමට විකසනයක් නිර්මාණය කරන්න.





















# 04 තාක්ෂණික ක්ෂේත්‍රය - ව්‍යාපාර කටයුතු


## මුදල් වර්ධනයට සොයමු නිසි ඉපයීම් මාර්ග





1. ඔබට දෛනිකව මුදල් ඉතිරි කළ හැකි ක්‍රම ලියන්න
2. මිටි සහල් මුට්ටිය යනු කුමක් ද?
3. කාසි කැටයක් නිර්මාණය කර ගුරුතුමාට /ගුරුතුමියට ඉදිරිපත් කර ලකුණු ලබා ගන්න.



4. නිවසේ කාර්යයන් හී දී නාස්තිවන වෙනත් දේ ලියන්න.
5. එම නාස්තිය වලක්වා ගැනීමට ඔබට කළ හැකි කාර්යයන් ලියන්න.






6. කාලය නාස්ති නොකර විවේක කාලය ඵලදායිව යොදා ගෙන ස්වයං රැකියාවක නිරත වීමට සුදුසු ක්‍රම ලියන්න.
7. ස්වයං රැකියාවක නිරත වීම නිසා ලැබෙන ආර්ථික වාසිවලට අමතරව ලැබෙන ප්‍රතිලාබ මොනවාද?
8. මුදල් තැන්පත් කළ හැකි ආයතන නම් කරන්න.







# 05 තාක්ෂණික ක්ෂේත්‍රය - රූපණ

## හැඩතල සහ වර්ණ යොදා මෝස්තර ගොඩනගමු






1. ඔබ කැමති හැඩතල අඳින්න.
2. ප්‍රස්තාර කොලයක් භාවිතා කර නැවතත් හැඩතල අඳින්න.
3. නිර්මාණයක් ලැබෙන ආකාරයට වර්ණ ගන්වන්න. නිර්මාණ එකතුවක් කර ගුරුතුමාට / ගුරුතුමියට ඉදිරිපත් කර ලකුණු ලබා ගන්න.






4. පෙළ පොතේ සඳහන් කඩදාසි නිර්මාණ කිරීමට යොමු වන්න.
5. ඔබට හැකි කඩදාසි නිර්මාණ කර ගුරුතුමාට / ගුරුතුමියට ඉදිරිපත් කර ලකුණු ලබා ගන්න.
6. සොයා ගැනීමට පහසු ද්‍රව්‍යක් භාවිත කර කැටයම් නිර්මාණ සඳහා යොමුවන්න.
7. ඇඳුම් සඳහා නිර්මාණය කර සරළ මෝස්තර යොදන්න.
8. විසිතුරු මැහුම් ක්‍රම සඳහා නියැදි පොතක් නිර්මාණය කරන්න. ගුරුතුමාට / ගුරුතුමියට ඉදිරිපත් කර ලකුණු ලබා ගන්න.













දුවේ, පුතේ ඔබ කැමති නිර්මාණ එකතුවක් කරන්න. (අවමය පහයි) එය විධිමත්ව හැකි ආකාරයකට ගුරුතුමියට / ගුරුතුමාට ඉදිරිපත් කර ලකුණු ලබා ගන්න.

ගුරුභවතුන්ට උපදෙස් -

- දරුවන් අගය කිරීමට පෙළඹෙන්න.
- දරුවන්ගේ ඇගයීම් වෙනුවෙන්, මෙම පාඩම් ආශ්‍රිතව, නිර්ණායක මත, ඇගයුම් ක්‍රමවේද නිර්මාණය කර ගන්න.
- නිදහස් නිර්මාණවලට සිසු දරුවන් යොමු කර අවස්ථා පහක් ඇගයීමට ලක් කරන්න.
- කාර්ය සාධන පත්‍රිකාව සඳහා ලබා දෙන ඇගයීම් ලකුණු මේ වෙනුවෙන් පිරිනමන්න.

